**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2019 (2020)</u>**

විභාග කොමසාරිස් ජනරාල් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව වෙත යොමු කරන ලදුව මෙම අමාත්‍යාංශය වෙත ලැබී ඇති 2021.04.25 දිනැතිව පවත්වන ලද උක්ත තරග විභාගයෙහි එක් එක් විෂයය සඳහා වෙන්කර ඇති ලකුණු වලින් අවම වශයෙන් සියයට හතළිහක් (40%) හෝ ඊට වැඩියෙන් ලබා සමත් වූ අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වන අයදුම්කරුවන්ගේ නාමලේඛනය මෙහි පළ කරනු ලැබේ. තවද විභාග නිවේදනයෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන බව සඳහන් වුවද ඇතැම් විෂයයන් සඳහා අවසන් අයදුම්කරුට සමාන ලකුණු ලබාගත් අයදුම්කරුවන් සිටීම හේතුවෙන් තුන් ගුණයකට වඩා වැඩියෙන් ද ඇතැම් විෂයයන් සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන් තුන් ගුණයකට වඩා අඩුවෙන්ද, මෙම ලේඛනයෙහි නම් ඇතුළත් කර ඇත. එමෙන්ම ඉංග්‍රීසි මාධ්‍ය විෂය අංක 12 - බටහිර සංගීතය සඳහා සුදුසුකම් ලැබූ එකදු අයදුම්කරුවකු හෝ නොමැති බව ද වැඩිදුරටත් දන්වමි.

02. මෙම නාම ලේඛනය **<u>හුදෙක් අයදුම්කරුවන්ගේ දැනගැනීම පිණිස</u>** පළ කෙරෙන අතර මෙහි නම් සඳහන් සියලු දෙනා බඳවා ගැනීමේ නිවේදනය ප්‍රකාරව අදාළ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා ඇත. **<u>මෙම නාම ලේඛනයේ නම සඳහන් වීම මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සුදුසුකම් ලබා තිබීම පමණක් ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීම සඳහා සුදුසුකමක් නොවන බව අවධාරණය කරනු ලැබේ.</u>** මෙය බඳවා ගැනීම සඳහා වන අවසාන නාම ලේඛනය නොවන බවද සැලකුව මැනවි.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය